AYURVEDA PANCHAKARMA TRAINING INSTITUTE
(APTI) KURUNEGALA

# Diploma in Ayurveda Panchakarma Therapy

# ආයුර්වේද පංචකර්ම ඩිප්ලෝමා පාඨමාලාව



Department of Ayurveda
Ministry of Indigenous Medicine

Ayu.Reg.No. 002

TVEC Reg.No. P12/0181

Head Offece: Mathawa Junction, Kohilegedara, Kurunegala, Sri Lanka.
Training Institute: Rathgalla, Boyagane, Kurunegala, Sri Lanka,
Web: apti.edu.lk Email: apti.edu.lk@gmail.com

# Diploma in Ayurveda Panchakarma Therapy

## ආයුර්වේද පංචකර්ම ඩිප්ලෝමා පාඨමාලාව

උසස් පිළිගැනීමකින් යුතු ආයුර්වේද පංචකර්ම වෘත්තිකයින් වශයෙන් පුහුණු කිරීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අංක 0002 යටතේ සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ P12/0181 යටතේ ලියාපදිංචි කරනු ලැබූ එස්.එම්.සී. පංචකර්ම ආයුර්වේද අධ්‍යාපන ආයතනය (A.P.T.I.) කුරුණෑගල, වයඹ පළාත මගින් ආරම්භ කිරීමට නියමිත ඉහත ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඔබටද අයදුම් කළ හැක.

සංචාරක ක්ෂේත්‍රයෙහි විශාල ඉල්ලුමකට ලක්ව ඇති ආයුර්වේද චිකිත්සා ක්‍රමයන් හි සියල්ල සපුරාලීමට අපට හැකියාව නොමැති වුවත් කාලීනව ඉහත ඉල්ලුමට ඇති ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව විධිමත් දැනුමක් ලබාදීමට පිළිගත් ආයතනයක් ලෙස අප ආයතනය තුළ ආරම්භ කරන මෙම පාඨමාලාව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලැබූ, හසල දැනුමක් ඇති ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල ආයුර්වේද වෛද්‍ය විශ්ව විද්‍යාලයන්හි කීර්තිධර ආචාර්යවරුන්ගේ සම්මුතියෙන් සැකසුනු විශේෂ පාඨමාලා හා නිර්දේශ මත මෙම ආයතනයේ අධ්‍යාපන හා පරිපාලන කටයුතු කරනු ලබයි.

- මෙම ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම පෞද්ගලික අංශයේ ආයුර්වේද රෝහල්/ආයුර්වේද සම්භාහන හා චිකිත්සාගාර/ විදේශීය හෝටල් ආදියෙහි කීර්තිමත් වෘත්තිකයින් ලෙස බඳවා ගැනීමට සුදුසුකමක් සේ සලකනු ලැබේ.
- මෙම පාඨමාලාවෙ නිබන්ධන සරල ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් පිලියෙල කර ඇත.
- දේශන සියල්ල සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.

## බඳවා ගැනීමේ සුදුසුකම්:

BAMS, BUMS, DSAC, DAMS අවසාන උපාධි වසරේ වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් හෝ DA විභාගය සමත් වෛද්‍යවරුන් වීම හෝ පාරම්පරික සර්වාංග ලියාපදිංචිය ලත් වෛද්‍යවරුන් වීම හෝ මෙම ආයතනය මගින් පංචකර්ම සහතික පත්‍ර පාඨමාලාව හැදෑරූ ලියාපදිංචිය ලත් අනෙකුත් වෛද්‍යවරුන් වීම, මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

# Diploma in Ayurveda Panchakarma Therapy

## පාඨමාලාවේ අන්තර්ගතය:

- ආයුර්වේද මූලධර්ම
- පංචකර්ම මූලධර්ම
- ශරීර විඥානය හා කායික විඥානය
- ව්‍යාධි වේදය
- ඖෂධ වේදය
- භෛෂජ්‍ය කල්පනා (විශේෂ පංචකර්ම වට්ටෝරු සඳහා බෙහෙත් සකස් කිරීම.)
- ශාස්ත්‍රීය පංචකර්ම-:(Classical) පිළිබඳ හැඳින්වීම (**වමන, විරේචන, රක්ත මෝක්ෂණ**)
- මේ සඳහා සුදුසු රෝගීන් තෝරා ගැනීම, රෝග රෝගී පරීක්ෂාව, රෝග චිකිත්සා පත්‍ර සැකසීම, අෂ්ඨවිධ පරීක්ෂාව, දශවිධ පරීක්ෂාව හා වෙනත් පරීක්ෂණ ක්‍රම, රෝගියා සූදානම් කිරීම, ප්‍රධාන ඖෂධ සැකසීම, මාත්‍රා නිර්ණය, විශේෂ රෝග සඳහා දේශීය පාරම්පරික හා ආයුර්වේද ක්‍රම අනුව පංචකර්ම, පූර්ව කර්ම හා ප්‍රධාන කර්ම යෙදීම, පශ්චාත් ප්‍රතිකාර ක්‍රම, සංසර්ජණ කර්ම, රෝගීන් ගේ පසු විපරම, විශේෂ රෝග සඳහා ආයුර්වේද හා බටහිර රෝග නිර්ණ ක්‍රම පිළිබඳ දැනුම **වස්ථී සහ නස්‍ය** කර්ම සම්බන්ධයෙන් ද, ඉහත කරුණු සියල්ලම ඇතුලත්ව විශේෂ රෝග අවස්ථා 32 ක් සඳහා කේරළීය හා දේශීය අත්දුටු විශේෂ ප්‍රතිකාර හා ඖෂධ වට්ටෝරු 45 සහ එම රෝග සඳහා දේශීය හා බටහිර දැනුම ලබා දීම. මෙහිදී (පූර්ව රූප, රූප, උපශය, සම්ප්‍රාප්ති සමග චිකිත්සා පත්‍ර ඇතුළත්ව)
- කේරළ පංචකර්ම - දැනට කේරළයේ බහුලව භාවිතා කරන විශේෂ කේරළ පංචකර්ම පහ සහ එහි මූලධර්ම, ක්‍රමවේද, යෙදිය හැකි අවස්ථා හා රෝගීන් , නොයෙදිය යුතු අවස්ථා හා රෝගීන් පිළිබඳ අංග සම්පූර්ණ දැනුම සමග අනෙකුත් කේරළ පංචකර්ම පිළිබඳ පූර්ණ දැනුම ලබා දීම.
- ආයුර්වේද පංචකර්මය හා බැඳුනු සංචාරක කර්මාන්තය හා සම්බන්ධ හෝටල්, පංචකර්ම නිකේතන, සම්භාහන ආයතන ආදිය තුල සිදුකරනු ලබන කළමනාකරණය පිළිබඳව හා ඒ හා සම්බන්ධ ආයුර්වේදයේ භූමිකාව පිළිබඳ, සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ දේශකවරුන් මගින් ලබාදෙන සුවිශේෂ දැනුම.

## Diploma in Ayurveda Panchakarma Therapy

- ආයුර්වේද පංචකර්මය ආයතන සඳහා බලපානු ලබන නීතිමය ව්‍යුහය, ආයතන පරිපාලනය හා කළමනාකාරිත්වය පිළිබඳව. **දේශීය හා විදේශීය රෝගීන් සඳහා යෙදිය හැකි අංග සම්පූර්ණ පංචකර්ම package මගින් ලබාදෙන සුවිශේෂ දැනුම.**
- පංචකර්ම චිකිත්සාගාරයක් නිර්මාණය කරගැනීම සඳහා උපදෙස් හා දැනුම ලබා දීම.
- දේශීය විදේශීය සංචාරකයින් සඳහා ස්පා, ඇරෝමා හා පිළිගත් සම්භාහන ක්‍රම හඳුන්වා දීම සහ ඒ සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම සමඟ අවශ්‍ය පුහුණුව ලබා දීම.

## DIPLOMA IN AYURVEDA AND PANCHAKARMA THERAPY

- **Introduction to Ayurveda**

History & Traditions

Veda & Darshan

Tools for Knowledge

Sankya philosophy of creation

## Diploma in Ayurveda Panchakarma Therapy

- **Definition of Ayurveda.**

## Fundamental Principles of Ayurveda

- Theory of 5 Great Elements
- Theory of 3 Functional Forces
- Theory of 7 Structural aspects
- Theory of formation of Sub-tissue elements
- Theory of 3 waste products
- Concept of Chakras & Nadis
- Concepts of Vital points
- Concepts of 5 Seaths
- 7 channels of body
- 3 pillars of human life
- Concept of elementary tract
- Concept of digestive and metabolic fire
- Concept of Vitality and Toxins
- Principles of Diet and Medicines
- Daily routines in Ayurveda
- Seasons and Seasonal routines
- Concept of natural urges

- **AYURVEDA PRACTICAL SESSION:**

- Abyangam (Herbal Oil massage therapy for the body)
- Shirodhara (Herbal Oil therapy for the head)
- Pizhichil (Herbal Oil bath therapy for the body)
- Swedanam (Sudation therapy in Ayurveda)
- Ela Kizhi (Bolus bag massage therapy with herbal leaves)

## Diploma in Ayurveda Panchakarma Therapy

- Podi Kizhi (Bolus bag massage therapy with herbal powders)
- Njavara Kizhi (Bolus bag massage therapy with medicated rice)
- Udhvarthanam (Herbal powder massage therapy for cellulites)
- Marma Massage (Vital point stimulation massage therapy)
- Kabalam & Gandoosha (Ayurvedic mouth wash and Oral therapy)
- Tharpanam (Eye treatment in Ayurveda)
- Karnapooranam (Ear treatment in Ayurveda)
- Kadi Vasti (Medicated Oil therapy for Lower back)
- Uro Vasti (Medicated Oil therapy for chest)

➢ **Panchakarma (Five-Fold Detoxification Therapy)**

<u>Penta detoxification treatments are</u>

- Vamana Karma: Therapeutically induced vomiting
- Virechana Karma: Therapeutically induced purgation
- Vasti karma: Medicated enemas which includes decoction and oil enema
- Nasya Karma: Administration of medicine through nasal drops
- Rakkthamookshana-blood letting

➢ **Post Panchakarma Phase**

➢ **Benefits of Panchakarma**

➢ **Identification of important medicinal herbs in Ayurveda.**

➢ **Spa and Aroma Massage Therapy**

➢ **Ayurveda massage therapy**

➢ **Special massage therapy in hotel**

➢ **Field visit**